ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය ජනතාවගේ නීරෝගීභාවය සහ සුබසිද්ධිය උදෙසා ශ්‍රී ලංකාව ප්‍රාර්ථනා එක් කරයි

ඉන්දීය රජය සහ ජනතාව වෙනුවෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ පූජ්‍ය පක්ෂයට සහ ජනතාවට ඉන්දීය ජනතාව පෙර නොවූ විරූ අයුරින් වසංගතයක් සමඟ ධෛර්යසම්පන්නව සටන් කරන මෙම අවස්ථාවේදී ඔවුන්ගේ සහෝදර ජනතාව වෙනුවෙන් ආශීර්වාද සහ ප්‍රාර්ථනා එක් කිරීම සම්බන්ධයෙන් හෘදයාංගම කෘතවේදීත්වය පළ කරයි.

2. මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් හට ඇමතුම් සහ පණිවුඩ විශාල සංඛ්‍යාවක් ලැබෙන අතර ඉන්දීය ජනතාවට නීරෝගීභාවය සහ සුබසිද්ධිය ප්‍රාර්ථනා කරමින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විශේෂ ආශීර්වාද පූජා සංවිධානය කෙරමින් පවතී.

3. ඉන්දීය ජනතාව වෙනුවෙන් ආශීර්වාද පූජා සහ වැඩසටහන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි පැවැත්විණ. විවිධ වෙහෙර විහාරස්ථානයන් හිදී අවස්ථා රැසකදී රතන සූත්‍රය සජ්ඣායනා කරන ලදී. 2021 අප්‍රේල් 29 වන දින වස්කඩුව රජගුරු ශ්‍රී සුභූති මහා විහාරයේ කපිලවස්තු සර්වඥ ධාතු මන්දිරයේදී අති පූජ්‍ය ආචාර්ය වස්කඩුවේ මහින්දවංශ මහා නායක හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද ; 2021 මැයි 1 වන දින ඇඹිලිපිටිය බෝධිරාජාරාමයේ සර්වඥ ධාතු මන්දිරයේදී අති පූජ්‍ය ආචාර්ය ඕමල්පේ සෝභිත නායක හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද ; එදිනම මාළිගාකන්ද අග්‍ර

ශ්‍රාවක විහාරය ඇතුළු විවිධ ස්ථානයන්හිදී මහා බෝධි සමාගමේ ප්‍රධානත්වයෙන් ද; 2021 මැයි 2 වන දින ත්‍රිකුණාමලය තිරියාය රජමහා විහාරස්ථානයේදී නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ගරු අනුරාධා යහම්පත් මහත්මිය විසින් ද සංවිධානය කරන ලද ආගමික වැඩසටහන් සහ 2021 මැයි 3 වන දින ගංගාරාම විහාරස්ථානයේ පැවති භාරත ආශිර්වාද පූජාව සහ 2021 මැයි 5 වන දින යාපනය ශ්‍රී නාග විහාරයේ දී පැවති ආශිර්වාද පූජාව ද මෙ අතර වේ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය 2021 මැයි 6 වන දින සිට සත් දිනක් පුරා පැවැත්වෙන රතන පිරිත් දේශනාවක් සංවිධානය කර ඇත.

4. හින්දු ආගමික මණ්ඩපය 2021 අප්‍රේල් 30 වන දින යාපනය කන්දරමඩම් නටරාජ් කෝවිලේදී වි ශේෂ පූජාවක් සංවිධානය කර තිබිණ. මෙම විශේෂ පූජාවේදී වේද් පාරයන් සහ තිරුමුරයි ගායනාවන් ද සිදු කරන ලදී. 2021 මැයි 2 වන දින කොළඹ ශිර්ඩි සායි මධ්‍යස්ථානයේදී ද විශේෂ පූජාවක් පැවැත්විණ. තව ද 2021 මැයි 7 වන දින කොළඹ මයුරාපති කෝවිලේදී ඉන්දීය ජනතාවගේ නිරෝගීභාවය උදෙසා ධන්වන්තරී දේවිය වෙනුවෙන් විශේෂ පූජාවක් පැවැත්වේ. 2021 මැයි 8 වන දින ශ්‍රී ලංකාවේ එස්වරම් කෝවිල් 5 දීම මහාම්‍රිතුංජය යාගය පවත්වනු ලැබේ.

5. 2021 මැයි 2 වන දින ඇංග්ලිකන් දේවස්ථානයේ දී ඉන්දියාව වෙනුවෙන් ඉරුදින දේව මෙහෙයක් පැවැත්විණ. ඉන්දියාවේ අධ්‍යාපනය ලද විවිධ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකිකයන් 2021 අප්‍රේල් 27 වන දින ඉන්දියාව වෙනුවන් සිය ප්‍රාර්ථනා එක් කළේය. ‘thinkingofindia’ සහ ‘PrayForIndia’ වැනි හැෂ්ටැග් ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය තුළ ජනප්‍රිය වෙමින් පවතී . තවත් විවිධ සංවිධාන සහ ව්‍යාපාරික ආයතන විසින් සුවිශේෂී වැඩසටහන් පවත්වමින් ඉන්දියාවට සහයෝගය පළ කරමින් සිටියි.

6. 2021 අප්‍රේල් 28 වන දින අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා වෙත ලිපියක් යොමු කරමින් ඉන්දියාවේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සංවේගය පළ කළේය. 2021 අප්‍රේල් 29 වන දින මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා සමඟ පැවති

හමුවේදී අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය සංවේගය සහ සහයෝගීතාවය අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා වෙත පළ කර සිටියේය.

7. මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සියවස් ගණනාවක් පුරා පවතින බැඳීම් සහ දෙරට ජනතාව අතර පවතින ගැඹුරු සබඳතාවයේ සැබෑ පිළිඹිබුවක් වන මෙම ආශිර්වාදයන් සහ ප්‍රාර්ථනා සම්බන්ධයෙන් ඉතා කෘතවේදී වේ.

*****

කොළඹ
2021 මැයි 5